අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref. PMO/SEC/01/01/01

ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.

දිනය / திகதி / Date 2023.12.29

**ඉතා වැදගත් / ප්‍රමුඛ**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත**

**ජාතික මෙහෙයුම් මැදිරිය යටතේ ක්‍රමෝපායනයට භාජනය කරන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති යලි සක්‍රිය කිරීමට සමගාමීව දියත් කිරීමට යෝජිත දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය**

රටතුල පැවැති අයහපත් මූල්‍ය තත්වය හමුවේ අත්හිටුවීමට ලක්ව, එහෙත් 2024 ජනවාරි මස සිට යලි සක්‍රියවීමට යෝජිත විදේශ මූල්‍ය ආධාර ප්‍රභව මඟින් මූල්‍යනය වන, ඔබ අමාත්‍යාංශය යටතේ ඇති මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම තුලින් අපේක්ෂිත අභිමතාර්ථයන් වෙත නියමිත නව කාල වකවානු තුල සාර්ථකව ළඟාවීම සහතික වනු පිණිස දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය ආයතනික ස්ථරයන් සමඟ සම්බන්ධීකරණය හා නිරන්තරව සහාය ලබා ගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට, අමාත්‍ය මණ්ඩලය විසින් අංක 23/විවිධ (070) හා 2023.12.11 දිනැතිව ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය කෙරෙහි ඔබ ක්ෂණික අවධානය යොමු කරවනු රිසියෙමි. (ඇමුණුම 01)

පසුගිය දශකය තුල රටතුල ක්‍රියාත්මක මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති අතුරින් 80% ක් පමණම සැලසුම් කල කාල වකවානු තුල නිම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකක මෙන්ම අමාත්‍යාංශීය අධීක්ෂණ ක්‍රියාවලින් අසමත්ව තිබීමද, වර්තමානයේදී අප විසින් මුහුණ දෙමින් සිටින මූල්‍ය අර්බුදයට එක් සාධකයක් බව අදාලව කරන ලද විශ්ලේෂණවලදී තහවුරුව ඇති බැවින්, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගතව පහත දැක්වෙන නව ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය 2024 මූල්‍ය වර්ෂය ආරම්භයේ සිටම සක්‍රිය වනු ඇත.

ඒ අනුව ඔබ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක එක් එක් මහා පරිමාණ ව්‍යාපෘති ආශ්‍රිතව පහත සඳහන් අනුපිලිවෙල යටතේ (අමුණා ඇති ආකෘතියට අනුගතව) සඳහන් නිර්දේශිත ක්‍රියාමාර්ගවලට එලඹෙන ලෙස අදාල ව්‍යාපෘති කළමනාකරණ ඒකක කඩිනමින්ම දැනුවත් කිරීමට පියවර ගත යුතුව ඇත.

(1) එක් එක් ව්‍යාපෘතියේ 2024 මුදල් වර්ෂය සඳහා විවිධ ව්‍යාපෘති සංරචක යටතේ අපේක්ෂිත කාර්තුමය ප්‍රගති (භෞතික/මූල්‍ය) ඉලක්ක.

(2) එක් එක් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී අදාළ ව්‍යාපෘතියේ සංරචක ක්‍රියාත්මක කෙරෙන පරිපාලන දිස්ත්‍රික්ක වෙන් වෙන්ව.

(3) ඉහත (1) කාර්තුමය ඉලක්ක ඇසුරෙන්, එක් එක් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශයන් තුල දියත් කෙරෙන ව්‍යාපෘති සංරචක ආශ්‍රිත කාර්තුමය ප්‍රගති (භෞතික/මූල්‍ය) ඉලක්ක.

(4) යම් හෙයකින් ඉහත (3) යටතේ එක් දිස්ත්‍රික්කයක් සඳහා නිශ්චිත මූල්‍ය ඉලක්ක ගණනය කිරීමේ අපහසුතාවක් නිරීක්ෂණය වන්නේ නම්, එකී සමස්ථ සංරචකවල කාර්තුමය ඉලක්ක ආශ්‍රිතව නිසි බර තැබීම් මත සකස් කෙරෙන අනුමාන දිස්ත්‍රික් කාර්තුමය (භෞතික/මූල්‍ය) ඉලක්ක.

කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143 2575454 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail secpm@pmoffice.gov.lk

ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පවතින එක් එක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් සකස් කොට ඔබ වෙත ඉදිරිපත් වන ඉහත 1, 2, 3 හා 4 දත්ත ඇසුරෙන් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් තුල ක්‍රියාත්මක සමස්ථ ව්‍යාපෘති සංරචක ගණන හා එමගින් එක් එක් දිස්ත්‍රික්කය තුල ඉදිරි මුදල් වර්ෂය තුල ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල කාර්තුමය (භෞතික/මූල්‍ය) ඉලක්ක හා එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා දිස්ත්‍රික්කය තුල නිර්මාණය වන,

(i) ස්ථිර / තාවකාලික පුහුණු හා නුපුහුණු රැකියා අවස්ථා ගණන.
(ii) ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා දිස්ත්‍රික්කය තුල කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වෙතින් සපයා ගැනීමට අපේක්ෂිත අමුද්‍රව්‍ය හා සේවාවන්.
(iii) ව්‍යාපෘතිය නිමවීමෙන් පසුව දිස්ත්‍රික්කය වෙත සැලසෙන නිශ්චිත මහජන සේවාවන්. (උදා: පානීය ජල සැපයුම් ගණන, කෘෂිකර්මාන්තය සඳහා නිකුත් වන අමතර ජල අක්කර අඩි ප්‍රමාණය, නව වෘත්තිය පුහුණු ඉඩ ප්‍රස්ථා ගණන, ජාතික නිෂ්පාදනයට එකතුවන භෝග වර්ගවල ප්‍රතිශතාත්මක වර්ධනය, අපනයන ඉපැයීම්වල අපේක්ෂිත වර්ධනය යනාදි වශයෙන්)
(iv) දිස්ත්‍රික්කය තුල 2024 වර්ෂයේදී ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති හරහා වියදම් කිරීමට අපේක්ෂිත මූල්‍යමය වටිනාකම හා අපේක්ෂිත කාර්තුමය ප්‍රගති ඉලක්ක.
(v) ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාළ දිස්ත්‍රික්කවලදී ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත සහායන් ලබාදිය යුතු රාජ්‍ය/පෞද්ගලික ආයතන කවරේද? ලබාදිය යුතු සහායන් කවරේද?

අංක 23/විවිධ (070) හා 2023.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2024 මුදල් වර්ෂයේ පළමු කාර්තුවේ සිට එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක විමධ්‍යගත අයවැය අරමුදල්, පළාත් සභා අරමුදල්, අමාත්‍යාංශ වෙත දේශීය අරමුදල් මගින් වෙන් කෙරෙන අරමුදල් හා විදේශ මුදල් ප්‍රභව මත ක්‍රියාත්මක මහා පරිමාණ සංවර්ධන ආයෝජන අරමුදල් යනාදී සියළුම ආකාරයේ රාජ්‍ය අරමුදල් සම්පාදන ක්‍රියාවලින් ආශ්‍රිතව සැලසුම්කරණය හා සම්බන්ධීකරණ සහායන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ස්ථාපිත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා ලබාදීමට නියමිතව ඇති බැවින්,

දිවයිනේ පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ඉහත දක්වන ලද නිර්ණායක මත පදනම්ව එක් එක් ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති සංරචක ක්‍රියාත්මක කිරීමේ "දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාත්මක ක්‍රමෝපායයන් 25" කඩිනමින්ම සකස් කර, **ජාතික මෙහෙයුම් මැදිරිය** මගින් බහුමානික දරිද්‍රතා දර්ශකය [Multidimentional Poverty Index (MPI)] පදනම් කොටගත් මූලික නිරීක්ෂණ හා මග පෙන්වීම් සමග දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කිරීම පිණිස 2024 ජනවාරි මස 15 දිනට ප්‍රථම මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

**අනුර දිසානායක**
අග්‍රාමාත්‍ය ලේකම්
**සභාපති, ජාතික මෙහෙයුම් මැදිරිය**

**පිටපත් -**

| | |
|---|---|
| (1) ජනාධිපති ලේකම් | - අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ආශ්‍රිතව එළැඹි අමප අංක 23/විවිධ (070) හා 2023.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා සබැඳේ. |
| (2) අමාත්‍ය මණ්ඩල ලේකම් | - අමප අංක 23/විවිධ (070) හා 2023.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ආශ්‍රිතව එළැඹි ක්‍රියාමාර්ග කා. දැ.ගැ. ස |
| (3) විගණකාධිපති | - කා.දැ.ගැ.ස |
| (4) ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස |
| (5) ජාතික මෙහෙයුම් මැදිරි නිල සාමාජික නිලධාරින් | - කා.දැ.ගැ.ස |
| (6) ලේකම් හා කැඳවුම්කරු, ජාතික මෙහෙයුම් මැදිරිය | - නිසි පසුවිපරම සඳහා |

අමාත්‍යාංශය :

ක්‍රියාත්මක පරිපාලන දිස්ත්‍රික්කය :

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති සංරචක | 2024 කාර්තුමය ප්‍රගති ඉලක්ක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | | දෙවන කාර්තුව | | තුන්වන කාර්තුව | | හතරවන කාර්තුව | |
| | | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික |
| (1) | 1.<br>2.<br>3.<br>4.<br>5. | | | | | | | | |
| (2) | 1.<br>2.<br>3.<br>4.<br>5. | | | | | | | | |
| (3) | 1.<br>2.<br>3.<br>4.<br>5. | | | | | | | | |
| (4) | 1.<br>2.<br>3.<br>4.<br>5. | | | | | | | | |
| (5) | 1.<br>2.<br>3.<br>4.<br>5. | | | | | | | | |
| වාර්ෂික සමුච්චිත එකතුව | | | | | | | | | |